2026 අගොස්තු 24

## ප්‍රවෘත්ති නිවේදනය

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මත පදනම් වූ විදුලි බලාගාර වලින් විදුලිය මිලදී ගැනීමේ මිල ගණන් (පෝෂක අයක්‍රමය) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පනවන ලද කොන්දේසි වලට යටත් ව නව පෝෂක ගාස්තු 2026 අගෝස්තු 25 වැනි දින (හෙට) සිට බලාත්මක වේ. මෙම පෝෂක ගාස්තු 2027 පෙබරවාරි 24 වන දින දක්වා වලංගු වේ. 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලි බල පනතේ 29 (3) උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පෝෂක අයක්‍රමයට අදාල ක්‍රමවේදය(මිල සූත්‍රය) සහ මිල ගණන් තීරණය කර තිබේ. අදාල මිල සූත්‍රය සහ මිල ගණන් තීරණය කිරීමේදී 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහජන උපදේශන මාලාවක් පවත්වන ලදී. එම උපදේශන වලදී ඉදිරිපත් වූ සාධනීය යෝජනා හා පිරිවැය දත්ත මත පදනම් ව රජයේ ප්‍රතිපත්ති සහ අදාල වන නීතිමය ප්‍රතිපාදන වලට අනුකූලව මිල සූත්‍රය සහ මිල ගණන් තීරණය කර ඇත.

ප්‍රනර්ජනනීය විදුලි ජනනයේ ස්වභාවය මත කාණ්ඩ 3ක් යටතේ නව පෝෂක අයක්‍රමය ප්‍රකාශයට පත් කර තිබේ. එම කාණ්ඩ සඳහා අදාල වන පෝෂක අයක්‍රම පහත දැක්වේ.

### 1. පුනර්ජනනීය විදුලි බලාගාර සඳහා පෝෂක අයක්‍රමය

| Type of Power Plant<br>බලාගාර වර්ගය | Feed in Tariff Components (LKR/kWh)<br>පෝෂක අයක්‍රම කොටස් (කිලෝ වොට් පැය 1ට රු) | | |
|---|---|---|---|
| | Non-escalable component*<br>ක්‍රමයෙන් වැඩි නොවන වියදම් කොටස | Escalable components<br>ක්‍රමයෙන් වැඩි වන වියදම් කොටස් | |
| | | Base O&M component<br>මූලික මෙහෙයුම් හා නඩත්තු වියදම් කොටස | Fuel Price component for year 2026<br>2026 සඳහා ඉංධන මිල කොටස |
| Mini hydro කුඩා ජල විදුලි බලාගාර | 30.37 | 4.50 | - |
| Wind සුළං බලාගාර | 20.80 | 4.93 | - |
| Biomass – Dendro ජෛව ස්කන්ධ-ඩෙන්ඩ්‍රෝ | 16.43 | 3.89 | 31.20 |
| Biomass - Agricultural/Industrial Waste ජෛව ස්කන්ධ-කෘෂි/කර්මාන්ත අපද්‍රව්‍ය | 14.29 | 3.39 | 17.80 |
| Municipal Solid Waste-නාගරික ඝන අපද්‍රව්‍ය | 41.72 | 14.83 | - |
| Waste Heat Recovery අපද්‍රව්‍ය තාපය මත පදනම් | 14.29 | 3.39 | - |
| Ground Mounted Solar PV භූමිය මත සවිකරන සූර්ය බලාගාර | 18.00 | 2.72 | - |
| Floating Solar PV පාවෙන සූර්ය බලාගාර | 23.58 | 3.92 | - |

## 2. විදුලි නිෂ්පාරිභෝගිකයින් සඳහා පෝෂක ගාස්තු ක්‍රම

<table>
<tr><th rowspan="2">Capacity Band<br>ධාරිතාවය</th><th rowspan="2" colspan="2">Prosumer Applicant Type<br>නව නිෂ්පාරිභෝගික වර්ගය</th><th colspan="2">Feed-in Tariff (LKR/kWh)<br>පෝෂක අයක්‍රමය(කිලෝ වොට් පැය 1ට රු)</th></tr>
<tr><th>At Prioritized Feed-in Time<br>ප්‍රමුඛතා පෝෂක කාලය සඳහා</th><th>At Other Periods<br>අනෙකුත් කාලයන් සඳහා</th></tr>
<tr><td>Up to 10kW<br>කිලෝ වොට් 10 දක්වා</td><td colspan="2">New Rooftop Solar PV<br>වහල මත සවිකරන නව සූර්ය බලාගාර සඳහා</td><td colspan="2">23.11</td></tr>
<tr><td>Above 10kW and up to 40kW<br>කිලෝ වොට් 10ට වැඩි කිලෝ වොට් 40 දක්වා</td><td colspan="2">New Rooftop Solar PV<br>වහල මත සවිකරන නව සූර්ය බලාගාර සඳහා</td><td colspan="2">19.15</td></tr>
<tr><td>Above 40kW and up to 250kW<br>කිලෝ වොට් 40ට වැඩි කිලෝ වොට් 250 දක්වා</td><td colspan="2">New Rooftop Solar PV<br>වහල මත සවිකරන නව සූර්ය බලාගාර සඳහා</td><td colspan="2">17.11</td></tr>
<tr><td rowspan="5">Above 250kW and up to 1000kW<br>කිලෝ වොට් 250ට වැඩි කිලෝ වොට් 1000 දක්වා</td><td colspan="2">New Rooftop Solar PV<br>වහල මත සවිකරන නව සූර්ය බලාගාර සඳහා</td><td colspan="2">15.81</td></tr>
<tr><td rowspan="2">New Rooftop Solar PV and BESS<br>වහල මත සවිකරන නව සූර්ය බලාගාර සහ බැටරි ගබඩා පද්ධති සඳහා</td><td>For first 15 years<br>මුල් වසර 15 සඳහා</td><td>45.53</td><td>15.81</td></tr>
<tr><td>For remainder of the SPPA period<br>සම්මත විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම් වල ඉතිරි කාලය සඳහා</td><td colspan="2">15.81</td></tr>
<tr><td rowspan="2">Existing Rooftop Solar PV prosumer applying for BESS<br>බැටරි ගබඩා පද්ධති සවිකිරීම සඳහා අයදුම්කරන දැනටමත් වහල මත සවිකල සූර්ය බල පද්ධති හිමිකරුවන් සඳහා</td><td>For first 15 years<br>මුල් වසර 15 සඳහා</td><td>33.51 + ($R_1^{/}$/0.95)</td><td>$R_1^{/}$</td></tr>
<tr><td>For remainder of the SPPA period<br>සම්මත විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම් වල ඉතිරි කාලය සඳහා</td><td colspan="2">$R_1^{/}$</td></tr>
<tr><td rowspan="5">Above 1000kW<br>කිලෝ වොට් 1000 වැඩි</td><td colspan="2">New Rooftop Solar PV<br>වහල මත සවිකරන නව සූර්ය බල පද්ධති සඳහා</td><td colspan="2">15.81</td></tr>
<tr><td rowspan="2">New Rooftop Solar PV and BESS වහල මත සවිකරන නව සූර්ය බලාගාර සහ බැටරි ගබඩා පද්ධති සඳහා</td><td>For first 15 years<br>මුල් වසර 15 සඳහා</td><td>42.49</td><td>15.81</td></tr>
<tr><td>For remainder of the SPPA period<br>සම්මත විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම් වල ඉතිරි කාලය සඳහා</td><td colspan="2">15.81</td></tr>
<tr><td rowspan="2">Existing Rooftop Solar PV prosumer applying for BESS<br>නව බැටරි ගබඩා පද්ධති සඳහා අයදුම්කරන දැනටමත් වහල මත සවිකල සූර්ය බල පද්ධති සඳහා</td><td>For first 15 years<br>මුල් වසර 15 සඳහා</td><td>30.27 + ($R_1^{/}$/0.95)</td><td>$R_1^{/}$</td></tr>
<tr><td>For remainder of the SPPA period<br>සම්මත විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම් වල ඉතිරි කාලය සඳහා</td><td colspan="2">$R_1^{/}$</td></tr>
</table>

## 3. බැටරි ගබඩා පද්ධති සහිත පුනර්ජනනීය බලාගාර සඳහා පෝෂක ගාස්තු ක්‍රමය

| Type of Power Plant<br>බලාගාර වර්ගය | Feed in Tariff (LKR/kWh) කිලෝ වොට් පැය 1ට රුපියල් | | | |
|---|---|---|---|---|
| | At Prioritized Feed In Tariff<br>ප්‍රමුඛතා කාල පෝෂක ගාස්තුව | | At Other Periods<br>සාමාන්‍ය කාල ගාස්තුව | |
| | Non Escalable Component<br>ක්‍රමයෙන් ඉහල නොයන කොටස | Escalable O&M Component<br>ක්‍රමයෙන් ඉහල යන මෙහෙයුම් හා නඩත්තු කොටස | Non Escalable Component<br>ක්‍රමයෙන් ඉහල නොයන කොටස | Escalable O&M Component<br>ක්‍රමයෙන් ඉහල යන මෙහෙයුම් හා නඩත්තු කොටස |
| Ground Mounted Solar PV<br>භූමිය මත සවිකරන සූර්ය බල පද්ධති | 47.08 | 3.02 | 18.00 | 2.72 |
| Floating Solar PV<br>පාවෙන සූර්ය බල පද්ධති | 53.28 | 4.36 | 23.58 | 3.92 |

තවද, 2027 පළමු කාර්තුවේ දී ඇති විය හැකි විදුලි හිඟය වැළැක්වීම සඳහා NSO විසින් ප්‍රමාණවත් විදුලි ගබඩා පද්ධති හා පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් විදුලි ජාලයට සම්බන්ධ කල යුතු බවට කොන්දේසියක් ද පනවා ඇත.

වැඩිදුර තොරතුරු සඳහා, ආයතනික සන්නිවේදන අධ්‍යක්ෂ - ජයනාත් හේරත් මහතා 077 294 3193 අමතන්න.